# මිලිබෑන්ඩ්ලා පැරදවීම

ප්‍රභාකරන් පැනගියේ ද එසේත් නැත්නම් ඊනියා යුද මුක්ත කලාපයෙහි සාමාන්‍ය ජනතාව සමග ජීවත්වන්නේ ද යන්න මේ ලිපිය ලියන විට ද නොවිසඳී ඇති ප්‍රශ්නයකි. මුළු ලොවෙහිම එ ප්‍රශ්නයට පිළිතුර දන්නා අය කිහිප දෙනකුට පමණක් සීමා විය යුතුය. ප්‍රභාකරන් කොහේ සිටියත් ඔහු පැරදවීම ලංකාණ්ඩුවේ වගකීම වෙයි. එහිදී අපට හරස් වන්නේ කවරහුද? පසුගියදා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේදී මුලතිව් ගැන ප්‍රකාශයක් කළ එරට විදේශ ඇමැති ඩේවිඩ් මිලිබෑන්ඩ් මහතා කියා සිටියේ ප්‍රභාකරන් අහිංසකයන් පිරිසක් මිනිස් පළිහක් මෙන් යොදා ගැනීම වරදක් බවය. එහෙත් ඔහු එ සමගම ප්‍රකාශ කළේ සාමාන්‍ය වැසියන්ට කරදරයක් නොවන අයුරින් ඔවුන් මුදාගත යුතු බවය. එ අතර ඔහු කලින් දිනෙක ඊනියා මානුෂික සටන් විරාමයක් ඇති කළ යුතු බව ද සඳහන් කළේය. බ්‍රිතාන්‍යයේ විදේශ කටයුතු පිළිබඳ ඇමැතිවරයා ලෙස ඔහු කරන ප්‍රකාශ සුළුවෙන් සැලකිය යුතු නොවේ.

මෙරට ඉංගිරිසි උගත් අය හා ඔවුන්ගෙන් ආභාසය ලබන අය අතරින් විශාල පිරිසක් තවමත් බ්‍රිතාන්‍යය කෙරෙහි ඉමහත් ගෞරවයකින් යුක්තව කටයුතු කරති. එහෙත් බ්‍රිතාන්‍යය යනු අපේ ප්‍රධාන සතුරා වෙයි. පසුගියදා මුලතිව්හි ඊනියා සිවිල් ජනයා වෙනුවෙන් ආධාර රැගත් නැවත එවීමට සූදානමින් සිටියේ ද බ්‍රිතාන්‍යය ය. එ ඊනියා දූත මෙහෙවරක් විය. එයට නම් තබා තිබුණේ මර්සි මිෂන් යනුවෙනි. එය සානුකම්පිත දූත මෙහෙවර හෝ බටහිරයන් අපට පුදුරු කිරීමට උත්සාහ කළ වචනවලින් නම් අනුකම්පා මීසම ලෙස පරිවර්තනය කළ හැකිය. අප බොහෝ විට සඳහන් කර ඇති ආකාරයට මෙරට සිටින යාපන දෙමළ ජනයාගේ සම්භවය ලන්දේසීන් විසින් දුම්කොළ වගාවට ගෙනෙන ලද වෙල්ලාල නමින් හැඳින්වෙන ජනයා වෙත යොමු වෙයි. වෙල්ලාලයන්ට මෙරට සම්භාවනීය තත්ත්වයක් ලබාදී මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන ලබා නොදීමටත් සිංහල බෞද්ධයන් පාගා දැමීමටත් ඔවුන් යොදාගනු ලැබුයේ බ්‍රිතාන්‍යයන් විසිනි. නෝර්වේ රාජ්‍යය යනු බ්‍රිතාන්‍යය විසින් දෙමළ ජාතිවාදය, බෙදුම්වාදය හා ත්‍රස්තවාදය ආරක්ෂා කිරීමට හා වර්ධනය කිරීමට යොදාගනු ලැබූ රාජ්‍යයක් පමණකි. සියල්ල, එනම් දෙමළ ජාතිවාදයට බෙදුම්වාදයට හා ත්‍රස්තවාදයට අවශ්‍ය මතවාද, මූල්‍ය හා සම්පත් ආධාර ආදී සියල්ල ඇත්තේ බ්‍රිතාන්‍යයය. අපට හරිහැටි කරුණු සොයාගත හැකිනම් කොටි සංවිධානයට ආයුධ හා සබ්මැරීන වැනි වෙනත් උපකරණ ලබාදීම පිටුපස ද සිටින ප්‍රධාන රට බ්‍රිතාන්‍යය බව දැනගැනීමට හැකිවනු ඇත.

මිලිබෑන්ඩ්ගේ සූදානම පැහැදිලිය. ඔහුට හා බ්‍රිතාන්‍යයට අවශ්‍ය හැකිනම් පළමුව එක්සත් ජාතීන්ගේ හමුදා මෙරටට එවා කොටි පරාජයෙන් ගලවා ගැනීමය. එ කළ නොහැකි නම් ජනාධිපතිතුමා ඇතුළු කිහිප දෙනකුට විරුද්ධව ඊනියා ජාත්‍යන්තර අධිකරණයේ යුද්ධ අපරාධ පිළිබඳ චෝදනා ඉදිරිපත් කිරීමටය. ඊනියා ජාත්‍යන්තර අධිකරණය ද වෙනත් බොහෝ ජාත්‍යන්තර ආයතන මෙන්ම ඇමරිකාව ප්‍රමුඛ බටහිරයන්ගේ අවශ්‍යතා සඳහා පිහිටුවාගෙන ඇති ආයතනයකි. එහි කිසි දිනෙක බටහිර යුරෝපීය රටවල නායකයන්ට විරුද්ධව යුද්ධ අපරාධ පිළිබඳ නඩු පැවරී නැත. එහෙත් යුද්ධ අපරාධ යැයි කියැවෙන දේ පිළිබඳ හොඳම නිදර්ශන ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහිය. ප්‍රභාකරන් මුලතිව්හි තවමත් ඇත්නම් මේ වන විට ඊනියා එක්සත් ජාතීන්ගේ හමුදා මෙරටට පැමිණ සිටිය යුතුය. මිලිබෑන්ඩ්ලා එදාත් අනෙක් රටවල ස්වෛරීභාවය තුට්ටුවකට මායිම් නොකළහ. ඔවුහු එදා අප රටවල් ආක්‍රමණය කර කොල්ල කෑහ. ඔවුහු අද මෙන් නගනව රටවල් ආක්‍රමණය නොකරති. එ වෙනුවට ඔවුන්ගේ උගතුන් ලවා සකස් කරවා ගන්නා ලද සංකල්ප, ප්‍රවාද ඇතුළු දැනුම යොදා ගනිති. පසුගිය දිනවල කතාබහට ලක්වුණු ආරක්ෂා කිරීමට ඇති අයිතිය හෙවත් රයිට් ටූ ප්‍රොටෙක්ට් යන්න ඉන් එක් සංකල්පයකි.

යුද මුක්ත කලාපයේ කොටුවී සිටින ජනයා සම්බන්ධයෙන් අනුගමනය කළ හැක්කේ එක් ප්‍රතිපත්තියක් පමණකි. එහිදී අපේ ප්‍රධාන පරමාර්ථය කුමක්ද යන්න පැහැදිලිව තේරුම්ගත යුතුය. අපේ ප්‍රධාන අරමුණ අන් කිසිවක් නොව කොටි සමූල ඝාතනය කිරීම හා රටේ ඒකීයභාවය ආරක්ෂා කරගැනීමය. එහිදී ඊනියා සිවිල් ජනයාගේ ජීවිත ආරක්ෂා කරගත හැකි නම් අප සතුටු වෙමු. එහෙත් ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරගැනීම කෙතරම් මානුෂික කටයුත්තක් වුවද එ අපේ ප්‍රධාන අරමුණ නොවෙයි. සිවිල් වැසියන් හෙවත් කොටුවී ඇති ජනයා ආරක්ෂා කිරීමට ගොස් කොටි සමූල ඝාතනය කරගත නොහැකි වුවහොත් රටේ ඒකීයභාවය ආරක්ෂා කරගැනීමට නොහැකි වුවහොත් හමුදාව මෙතෙක් කර

© Prof. Nalin De Silva

ඇති කැපවීම්වලට කුමක් සිදුවන්නේද? මුලතිව්හි සිවිල් වැසියන්ගේ ඊනියා මානව අයිතිවාසිකම් ගැන කතා කරන ඇතැම් විශ්වවිද්‍යාල ආචාර්යවරු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මා අස් කළ විට මගේ පැමිණිල්ල මා සාමාජිකයකු හා සභාපතිව සිටි ආචාර්ය සංගම්වලට ඉදිරිපත් කිරීමට ඉඩ නොදීම තරම් මානව දයාවෙන් පිරී ඉතිරී ගිය ඇත්තෝ වූහ. ඔවුන්ගෙන් එක් අයකු ව්‍යවස්ථාදායක මණ්ඩලයට ද නම් කෙරී ඇත. ඔහු ඒ තනතුරට පත් වුවහොත් ක්‍රියා කරන්නේ කෙසේදැයි අපට සිතාගත හැකිය.

මිලිබෑන්ඩ්ලාට ඇති මානව දයාවක් නැත. ඔවුන්ගේ මානව දයා ඇත්තේ පොත්වල පමණය. බ්‍රිතානියේ පමණක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පැවැත්මට තර්ජනයක් එල්ල වන අවස්ථාවකදී මිලිබෑන්ඩ්ලා ක්‍රියා කරන්නේ කෙසේදැයි අපි දනිමු. අද ඇෆ්ගනිස්තානයට එරෙහිව කරන සටන් තව තවත් වර්ධනය කළ යුතු යැයි බරක් ඔබාමා තම මිතුරු රටවලට කියයි. බුෂ් මෙන්ම බරක් ඔබාමා ද ලෝකයට බරක් බව වැඩිකල් නොගොස් ලෝකයා තේරුම් ගනු ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් පසුගිය අවුරුදු පන්සීයයක කාලයක් තිස්සේ මිලිබෑන්ඩ්ලා විසින් ඝාතනය කෙරී ඇති සංඛ්‍යාව දළ වශයෙන් වුවද ගණන් බැලීමට සුදුසු කාලයක් පැමිණ ඇත. අප මිලිබෑන්ඩ්ලාගේ බයිලා තුට්ටු දෙකකට මායිම් කළ යුතු නොවෙයි. කොටුවී සිටින ජනයා අතර ඇති කොටි සොයා යන්නේ කෙසේදැයි හමුදාව දනියි. හමුදාව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය කුමක්දැයි ප්‍රසිද්ධියේ සාකච්ඡා කළ යුතු නොවේ. එහෙත් ප්‍රතිපත්තියක් ලෙස අපට මේ අවස්ථාවේදී වැදගත් වන්නේ මිලිබෑන්ඩ්ලාගේ හා අනෙක් සියල්ලන්ගේ උප්පරවැට්ටිවලින් රටේ ස්වෛරීභාවය මේ තිබෙන ප්‍රමාණයෙන් වුවද ආරක්ෂා කර ගැනීමය. එහිදී කොටුවී සිටින ජනයා ඝාතනය වේ නම් ඒ ගැන කළ හැකි කිසිවක් නැත. හැකිතාක් දුරට ඔවුන්ගේ ජීවිත බේරාගැනීම ආණ්ඩුවේ යුතුකමකි. එහෙත් ඒ කළ නොහැකි නම්, ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා රටේ ස්වෛරීභාවය හා කොටි සමූල ඝාතනය කිරීමට ඇති අවස්ථාව පාවා දිය යුතු නැත.

යම් අයුරකින් ප්‍රභාකරන්, ඔහුගේ පුත්‍රයා, පොට්ටුඅම්මාන් වැනි ඉහළම නායකයන් පැනගොස් ඇත්නම් බ්‍රිතානීන් ඔවුන් යොදාගෙන මුහුදින් එතෙර සිට ඊළමක් ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත. බ්‍රිතානිය එයට සෘජුව මැදිහත් නොවුණ ද එවැන්නක් කෙරෙනු ඇත්තේ ඔවුන්ගේ අනුදැනුම, අනුග්‍රහය හා උපදෙස් යටතේය. ඇතැම්විට නෝර්වේ රාජ්‍යය ලවා එවැනි ඊළමක් පිළිගැනීමට ද බ්‍රිතානිය කටයුතු කරනු ඇත. ඒ නැතත් බ්‍රිතානිය ඉන්දියාව ලවා දහතුන් වැනි ව්‍යවස්ථාවෙන් ඔබ්බට යන ඊනියා විසඳුමක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරනු ඇත. ඉන්දියාව ද වයිකෝලා සතුටු කිරීමට එයට කරගසනු ඇත. එහිදී ද යම් අයුරකින් මුහුදින් එතෙර සිට ඊළමක් පිහිටුවුවහොත් එවැනි අවස්ථාවක දී ද රජය ඒ සියල්ලටම විරුද්ධව කටයුතු කළ යුතුය. එපමණක් නොව හැකිනම් පළාත් සභා අහෝසි කිරීමට කටයුතු කළ යුතුය. අද මුරලිදරන් (කරුණා අම්මාන්) ඇමැතිවරයා වුවද පවසන්නේ බලතල විමධ්‍යගත කිරීම අනවශ්‍ය බවය. අද නැගෙනහිර පළාතේ කුමක් හෝ සංවර්ධනයක් සිදුවන්නේ එහි පළාත් සභාවෙහි ආනුභාවයක් නිසා නොව ලංකාණ්ඩුව ඒ කටයුත්තට අත ගසා ඇති බැවිනි. පළාත් සභා අහෝසි කිරීම මේ අවස්ථාවේ ගැටලු සහගත නම් එවාට දැනට දී ඇති බලතලවලට එහා යන අබමල් රේණුවක බලයක් හෝ නොදිය යුතුය.

ආණ්ඩුවට ඒ ප්‍රතිපත්තියෙහි සිටීමට බලපෑම් ඇති කිරීමට ජනතාවට සිදුවෙයි. සිංහලයන්ගෙන් සියයට හැත්තෑවකට ආසන්න ප්‍රමාණයක් ඒ ප්‍රතිපත්තියට එකඟ කරගැනීමට හැකිනම් ආණ්ඩුවට ඒ ශක්තිය මත පදනම් වී මිලිබෑන්ඩ්ලා පරාජය කළ හැකි බව පසුගිය අවුරුදු දෙකහමාරක ඉතිහාසයෙන් අපට ඉගෙනගත හැකි පාඩම වෙයි. හමුදා මෙහෙයුම්වලට එරෙහිව ඊනියා ජාත්‍යන්තර බලපෑම් තිබුණ ද, සුදු නෙළුම් ගෙන අවලම් තවලම් ගිය ඇතැම් චන්ද්‍රිකා හිතවාදී ඇමැතිවරුන්ගේ කන්කෙඳිරි තිබුණ ද මහින්ද රාජපක්ෂ මහතාට ජනතාවගේ සහාය විය. පළාත් සභාවලට පක්ෂ ඇමැතිවරුන් ද මිලිබෑන්ඩ්ලා ද පරාජය කිරීමට එක මතයකට පැමිණි සිංහලයන්ට හැකිය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva